JMC vLearning
"your virtual learning partner"

# පුද්ගලයින්ගේ සහ සමාගම්වල (නේවාසික) බදුකරණය

## AAT අදියර III
## CPT - සංස්ථාපිත සහ පුද්ගලික බදුකරණය

නුවන් සමීර
B.Sc. (Accountancy) Sp., CBA, ACCA Finalist

JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය
JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

JMC Jayasekera Management Centre (Pvt) Ltd
Pioneers in Professional Education
65/2A, Chittampalam Gardiner Mawatha, Colombo 02 | T: +94 112 430451 | E: info@jmc.lk | F: +94 115 377917

පරිච්ඡේදය 5

# තනි පුද්ගල බදුකරණය
**(Taxation of Individual)**

2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ විධිවිධාන අනුව ඕනෑම පුද්ගලයෙකුට උද්ගත වන ආදායම් ප්‍රභව වන්නේ,

1. සේවා නියුක්තිය මත තක්සේරු වන ආදායම
2. ව්‍යාපාර මත තක්සේරු වන ආදායම
3. ආයෝජන මත තක්සේරු වන ආදායම
4. අනෙකුත් කටයුතු මත තක්සේරු වන ආදායම

මෙම ආදායමේ බදු කටයුතු සඳහා තක්සේරු කරන ආකාරය පිළිබඳව ඉහත දී සාකච්ජා කර ඇත.

ඒ අනුව තනි පුද්ගලයකු විසින් ගෙවිය යුතු ආදායම් බද්ද තක්සේරු කිරීම පහත ආකාරයට විස්තර කළ හැකිය.

පුද්ගලයාගේ නම :

තක්සේරු වර්ෂය :

ආදායම් බදු ගණනය

| | + | - | බදු නිදහස් ආදායම් | බද්දට යටත් ආදායම් |
|---|---|---|---|---|
| සේවා නියුක්ති ආදායම | x | (x) | (x) | xxx |
| ව්‍යාපාර ආදායම | | | | xxx |
| ආයෝජන ආදායම | | | | xx |
| අනිකුත් ආදායම් | | | | xx |
| මුළු තක්සේරුවන ආදායම | | | | xxx |
| <u>52 වගන්තියට අනුව</u> | | | | |
| සුදුසුකම් ලබන | | | x | |
| ගෙවීම් සහ සහන | | | x | |
| | | | | (xx) |
| බදු අයවන ආදායම | | | | xxx |

JMC vLearning "your virtual learning partner"

| | | | | |
|---|---|---|---|---|
| **<u>බදු ගණනය</u>** | | | | |
| අදාළ බදු අනුපාත පනතේ උපලේඛණ වලට අනුව (පළමු උපලේඛණය) | | | | xxx |
| ගෙවිය යුතු බද්ද | | | | xxx |
| (-) බදු බැර | | | | (xx) |
| ගෙවිය යුතු ඉතිරි / (වැඩිපුර ගෙවූ) බද්ද | | | | xxx |

ඒ අනුව තක්සේරු වන ආදායම තෙක් ගණනය කිරීම පිළිබඳ අවබෝධය අප ඉහත දී ආවරණය කර ඇත.

**<u>බදු අයවන ආදායමට ගණනය</u>**

පනතේ 52 වන වගන්තියේ සඳහන් වන සුදුසුකම් ලබන ගෙවීම් සහ සහන අඩු කිරීමෙන් එම තැනැත්තාගේ බදු අයවන ආදායම ආගණනය කළ හැකිය. ඒ සඳහා මෙම සුදුසුකම් ලබන ගෙවීම් සහ සහන පිළිබඳ අවබෝධය වැදගත් වේ.

**<u>සුදුසුකම් ලබන ගෙවීම් සහ සහන - 52 වගන්තිය</u>**

පස්වන උපලේඛනයේ සඳහන් සහන

a. පුද්ගල බදු සහනය තක්සේරු වර්ෂයට රු. 3,000,000 කි.

b. මුලු කුලී ආදායම් තක්සේරු වන කොටස මත 25% ක දීමනාවක් (සත්‍ය අළුත් වැඩියා අඩු කර නොමැති විට)

c. වාසික පුද්ගලයෙකු හෝ හවුල් ව්‍යාපාරයක හවුල් කරුවෙකු ශ්‍රී ලංකාව තුල හෝ ඉන් පිටත සැපයූ සේවා මත විදේශ විනිමය ලැබීම්.

d. 2020.01.01 දිනෙන් පසුව ක්‍රියාත්මක වන පරිදි වාසික පුද්ගලයෙකුගේ ආදායම් බද්ද ගණනය කිරීමේදී තක්සේරු වර්ෂය තුලදී එම පුද්ගලයා විසින් දරන ලද පහත වියදම්වල එකතුව රු. 1,200,000 දක්වා අඩු කරගත හැක.

- වෛද්‍ය රක්ෂණ, දායක (රක්ෂණ වාරික) ඇතුලුව සෞඛ්‍ය වියදම්
- දරුවන් වෙනුවෙන් දරන ලද දේශීය අධ්‍යාපන වියදම්
- නිවාස ණය සඳහා පොලී ගෙවීම්
- අනුමත විශ්‍රාම ක්‍රමයකට ගෙවන ලද දායක මුදල්
- සාධනපත් හෝ සූරැකුම්පත් මිලදී ගැනීම සඳහා දරන ලද වියදම්

JMC vLearning "your virtual learning partner"

**<u>පස්වන උපලේඛණයේ සඳහන් සුදුසුකම් ලබන ගෙවීම්</u>**

e. පහත කොන්දේසි සපුරන අනුමත පුන්‍ය ආයතනයකට සිදු කළ පරිත්‍යාග.

| | |
|---|---|
| i. | අනුමත පුන්‍ය ආයතනයකට |
| ii. | මුදලින් කල පරිත්‍යාග |
| iii. | එම පුණ්‍ය ආයතනය **<u>අවශ්‍ය තැනැත්තන්ට</u>** ආයතනිකමය රැකවරණය සපයන විට. |

පහත සීමාවන්ට යටත්ව අඩු කළ හැක.

| | | |
|---|---|---|
| ❖ උපරිමය | රු. 75,000 | |
| ❖ මුලු තක්සේරුවන ආදායමින් 1/3 | xxx | xxx |
| සත්‍ය පරිත්‍යාග වියදම | | xxx |

← යන අගයන්ගෙන් වඩා අඩු අගය

f. පහත ආයතනයකට **<u>මුදලින් හෝ වෙනත් අයුරකින්</u>** සිදු කළ පරිත්‍යාග සීමාවකින් තොරව අඩු කළ හැකිය.

i. ශ්‍රී ලංකා රජයට
ii. විශ්ව විද්‍යාල පනතට යටත්ව පිහිට වූ උසස් අධ්‍යාපන ආයතනයකට
iii. බෞද්ධ හා පාලි විශ්ව විද්‍යාලයට
iv. ශ්‍රී ලංකා රජය විසින් පිහිට වූ අරමුදලකට
v. ප්‍රාදේශීය අධිකාරියක් මගින් ඇමතිවරයාගේ අනුමැතිය මත පිහිට වු අරමුදලකට
vi. පළාත් පාලන ආයතනයකට
vii. සෙවණ අරමුදලකට
viii. පළාත් සභා මගින් ඇමතිවරයාගේ අනුමැතිය මත පිහිට වූ අරමුදලකට
ix. අපි වෙනුවෙන් අපි අරමුදලට
x. ජාතික වකුගඩු අරමුදලට
xi. රාජ්‍ය සංස්ථාවක් මගින් ජනාධිපති අරමුදලට ප්‍රේෂණය කළ ලාභ

* ඉහත සුදුසුකම් සපුරන ගෙවීම් හෝ සහන අඩු කළ පසු එම තැනැත්තාගේ බදු අයවන ආදායම ගණනය කළ හැකිය.

**<u>ප්‍රශ්නය 01</u>**

ප්‍රනාන්දු මහත්මියට 2020/21 තක්සේරු වර්ෂයේදී පහත ආදායම් ලැබී ඇත.

| | |
|---|---|
| සේවා නියුක්ත ආදායම | රු. 800,000 |
| ව්‍යාපාර ආදායම | රු. 200,000 |
| ආයෝජන ආදායම | රු. 400,000 |

JMC eLearning "your virtual learning partner"

ආයෝජන ආදායම තුල ප්‍රාග්ධන ලාභ රු. 100,000 ක් ද පොලී ආදායම රු. 300,000 වේ.

තක්සේරු වර්ෂය තුල ප්‍රනාන්දු මහත්මියට වෙනත් ආදායම් ලැබී නොමැත.

**අවශ්‍ය වන්නේ,**
2020/21 තක්සේරු වර්ෂය සඳහා බදු අයකළ හැකි ආදායම ගණනය කරන්න.

## ගෙවිය යුතු බද්ද ගණනය කිරීම

බදු අයවන ආදායම මත ගෙවිය යුතු බද්ද ගණනය කිරීම සඳහා අදාල බදු අනුපාත පනතේ පළමුවන උපලේඛණවල සඳහන් වන ආකාරයට පහත දක්වේ. ඒවා ආදාල පරිදි යොදා ගැනීමෙන් එම තැනැත්තාගේ ගෙවිය යුතු බදු වගකීම ගණන කල හැකිය.

පනතේ පළමු උපලේඛණයට අනුව,

1. **සාමාන්‍ය පුද්ගලයෙකුගේ ආදායම් මත සාමාන්‍ය බදු අනුපාත**
   යෝජිත බදු සංශෝධිත අනුව 2020/01/01 වන දින සිට තනි පුද්ගලයන්ට පහත අනුපාත අදාල වේ. ඒ අනුව බදුවන ආදායමේ,
   - ➢ පළමු 3,000,000 - 6%
   - ➢ ඊළඟ 3,000,000 - 12%
   - ඉතිරිය මත - 18%

**තනි පුද්ගලයෙකුට අදාළ වන අඩු බදු අනුපාත**

2. **ආයෝජන වත්කම් විකිණීමේ ලාභ මත** **10%**

3. **සේවා නියුක්ති ආදායමේ සඳහන් බද්දට යටත් සේවාන්තික ලැබීම් මත,**

   2020/01/01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සේවාන්තික ප්‍රතිලාභ මත අඩු බදු අනුපාත පහත පරිදිය.
   පළමු රු. මිලියන 10 ⟶ 0%
   ඊළඟ රු. මිලියන 10 ⟶ 6%
   ඉතිරිය මත 12%

**තනි පුද්ගලයෙකුට අදාළ වැඩි බදු අනුපාත**

- ඔට්ටු ඇල්ලීමේ සහ සූදු, මත්පැන් හෝ දුම්කොළ යන ඒවායින් සමන්විත වන ව්‍යාපාරයකින් ලැබෙන ආදායම මත - 40%.
  ඉහත අදාල බදු අනුපාත යොදා ගනිමින් එම තැනැත්තා ගෙවිය යුතු බදු වගකීම ගණනය කළ හැකි අතර එම වගකීම මත මෙතෙක් නිරවුල් කර ඇති බදු මුදල් වේ නම් අඩු කර ගැනීමේ අයිතිය පුද්ගලයෙකු සතු වේ. එම අයිතිය **බදු බැරක්** වශයෙන් හඳුනා ගනී.

**<u>පුද්ගලයෙකුට අදාල බදු බැර</u>**

1. ගෙවූ පුද්ගල අත්තිකාරම් බදු
2. ස්වතක්සේරු බදු ගෙවීම්
3. විදේශ බදු බැර
4. ගෙවූ ආර්ථික සේවා ගාස්තු
5. හවුල් ව්‍යාපාර ලාභ මත ගෙවූ රඳවාගත් බදු

ඒ අනුව ගෙවිය යුතු බද්දට ඉහත සඳහන් බදු බැර තිබේනම් අඩු කිරීමෙන් (හිලව්) එම තැනැත්තාගේ ගෙවිය යුතු ඉතිරි බදු වගකීම් හෝ වැඩිපුර ගෙවූ බද්ද ගණනය කළ හැකිය.

පුද්ගලයා විසින් පහත තුන් ආකාරයට බදු ගෙවිය යුතුය.

| | | |
|---|---|---|
| 1. | තක්සේරු කිරීමෙන් (ඉහත සඳහන් පරිදි) | = xxx |
| 2. | රඳවා ගැනීමේ බදු | = xxx |
| 3. | වාරික වශයෙන් ගෙවීම | = xxx |
| | මුළු බදු ගෙවීම් | = xxx |

JMC vLearning "your virtual learning partner"

# සමාගම් බදුකරණය (Company Taxation)

_______________ සමාගම

_______________තක්සේරු වර්ෂය සඳහා ආදායම් බදු ගණනය

| | | |
|---|---|---|
| ව්‍යාපාර ආදායම | | xxx |
| ආයෝජන ආදායම | | xxx |
| වෙනත් ආදායම | | xxx |
| මුලු තක්සේරු වන ආදායම (Total Assesable Income) | | xxxx |
| (-) 52 වන වගන්තිය අනුව සුදුසුකම් ලබන ගෙවීම් සහ සහන | | (xxx) |
| බදුවන ආදායම (Taxable Income) | | xxx |
| **දළ ආදායම් බද්ද ගණනය** | | |
| බදුවන ආදායම x අදාල බදු අනුපාත (පළමුවන උපලේඛනය) | | xxx |
| (-) බදු බැර (Tax Credit) | | |
| • වාරික ගෙවීම් | (xx) | |
| • ESC ගෙවීම් | (xx) | |
| • රඳවා ගැනීමේ බදු (WHT) | (xx) | (xxx) |
| ඉතිරි ගෙවිය යුතු බදු වගකීම් (Balance tax payable) | | xxxx |

**සමාගම් සම්බන්ධව සුදුසුකම් ලබන ගෙවීම්**

➢ **පරිත්‍යාග**

A. පහත ආයතනයකට මුදලින් හෝ වෙනත් ආකාරයකින් සිදුකල පරිත්‍යාග සීමාවකින් තොරව අඩු කළ හැකිය.

1. ශ්‍රී ලංකා රජයට
2. විශ්ව විද්‍යාල පනත යටතේ පිහිට වූ උසස් අධ්‍යාපන ආයතනයකට
3. බෞද්ධ හා පාලි විශ්ව විද්‍යාලයට
4. ශ්‍රී ලංකා රජය විසින් පිහිට වූ අරමුදලකට
5. ප්‍රාදේශීය අධිකාරියක් මගින් ඇමතිවරයාගේ අනුමැතිය මත පිහිට වූ අරමුදලට
6. පළාත් පාලන ආයතනයකට
7. සෙවණ අරමුදලකට
8. පළාත් අධිකාරිය මගින් ඇමතිවරයාගේ අනුමැතිය මත පිහිට වූ අරමුදලට
9. අපි වෙනුවෙන් අපි අරමුදලට
10. ජාතික වකුගඩු අරමුදලට
11. රාජ්‍ය සංස්ථාවක් මගින් ජනාධිපති අරමුදලට කල ප්‍රේෂණ

B. අනුමත පුණ්‍යායතනයකට **<u>මුදලින්</u>** කළ පරිත්‍යාග පහත සීමාවන්ට යටත්ව අඩු කිරීමට ඉඩ දේ.

| | | | | |
|---|---|---|---|---|
| උපරිමය | - 500,000 | යන අගයන්ගෙන් වඩා අඩු අගය | | |
| හෝ | | | | |
| 1/5 x මුලු තක්සේරුවන ආදායම | - xxx | | xxx | යන අගයන්ගෙන් වඩා අඩු අගය |
| සත්‍ය මුදල් පරිත්‍යාග වියදම | | | xxx | xxx |

C. 2020/01/01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඕනෑම රාජ්‍ය සංස්ථාවක් විසින් ඒකාබද්ධ අරමුදලකට කරන ලද ගෙවීම් එම සංස්ථාවේ ආදායම් බද්ද ගණනය කිරීමේදී අඩු කරගත හැක.

**<u>සමාගම් සඳහා බන බදු අනුපාත</u>**

2020/04/08 දින දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද දැන්වීම අනුව, 2020/01/01 දින සිට (බලපැවැත්වෙන පරිදි) සංශෝධන යෝජනා කර ඇත.

(අ) සමාගමක බදු අය කළ හැකි ආදායම මත - 24%

(ආ) පහත දැක්වෙන විශේෂිත ව්‍යාපාර මගින් ලබන ලැබීම් සහ ලාභ මත - 14%

- කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායන්
- ගෙවීම විදේශ ව්‍යවහාර මුදලින් ලැබෙන්නේ නම් සහ ශ්‍රී ලංකාවට බැංකුවක් හරහා ප්‍රේෂණය කරන්නේ නම්, එවැනි භාණ්ඩ අලෙවි කිරීමේ හෝ විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.
- නිශ්චිත ව්‍යාවසායන්
- ඉදිකිරීම්
- කෘෂි සැකසුම්
- සෞඛ්‍ය සේවා
- වාසික සමාගමකින් ලැබෙන ලාභාංශ

(ඇ) නිෂ්පාදනය මගින් ලබන ලැබීම් සහ ලාභ මත - 18%

(ඈ) ඔට්ටු ඇල්ලීම සහ සූදු මගින් ලබන ලැබීම් සහ ලාභ මත - 40%

(ඉ) මත්පැන් හෝ දුම්කොළ නිෂ්පාදනයන්, නිෂ්පාදනය කිරීම සහ විකිණීම හෝ ආනයනය කිරීම මගින් ලබන ලැබීම් සහ ලාභ මත - 40%

- **සුලු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්**

  (i) ශ්‍රී ලංකාව තුල පමණක් ව්‍යාපාර කටයුතු සිදු කරන තැනැත්තෙකු

  (ii) අස්ථිත්වයක් වන ආශ්‍රිතයකු නොමැති තැනැත්තෙකු

  (iii) එම තැනැත්තාගේ වාර්ෂික දල පිරිවැටුම රු. මිලියන 500 කට අඩුවන තැනැත්තෙකු

JMC vLearning "your virtual learning partner"

**නිශ්චිත ව්‍යාවසාය යන්නෙන්**

(a) අපනයනය කිරීම, සුළු වශයෙන් පිරිසැකසුම් කිරීම හා ප්‍රතිඅපනයනය කිරීම හා සම්බන්ධ යම් ව්‍යාපාර කේන්ද්‍රීය වෙළඳාමක නිරතව සිටින.

(b) එක් රටකින් භාණ්ඩ ප්‍රතිසම්පාදනය කර හෝ එක් රටක භාණ්ඩ නිෂ්පාදනය කර එම භාණ්ඩ ශ්‍රී ලංකාවට ගෙන ඒමෙන් තොරව වෙනත් රටකට නැව්ගත කිරීමේ අක්වෙරළ ව්‍යාපාරයක යෙදී සිටින.

(c) විදේශයන්හි සේවාදායකයන් සඳහා සේවා සැපයීමේ යෙදී සිටින.

(d) මූල්‍ය සැපයුම් ජාලය, බිල්පත් මෙහෙයුම් කටයුතු කළමනාකරණය සඳහා ප්‍රධාන පෙළේ ගැණුම්කරුවන්ගේ ප්‍රධාන කාර්යාලීය මෙහෙයුම් කටයුතුවල යෙදී සිටින.

(e) ශ්‍රී ලංකාවේ බන්ධිත ගුදම් හෝ බහු පාර්ශවීය ඒකාබද්ධ කිරීම් වැනි කාර්යය සම්පාදන සේවාවල යෙදී සිටින.

(f) අන්තර් නැව්ගත කිරීමේ කටයුතුවල යෙදී සිටින.

(g) භාණ්ඩ මෙහෙයුම් කටයුතුවල යෙදී සිටින.

(h) විදේශ ව්‍යවහාර මුදලින් ගෙවීම් ලබන නැව් මෙහෙය වන්නන්ට සපයනු ලබන සේවා. (නැව් අලුත්වැඩියා ඇතුළුව)

(i) විදේශ ව්‍යවහාර මුදලින් ගෙවීම් ලබන ශ්‍රී ලංකාව තුළදී මැණික් හෝ ස්වර්ණාභරණ අලෙවි කරන යම් ව්‍යවසායක් අදහස් වේ.

JMC vLearning "your virtual learning partner"